තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය.

**ආර් ඒ රත්නදාස එ. බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය**

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය)/ 114 /2018 (2018.04.18 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යා පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යා පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - ආර් ඒ රත්නදාස
**නොතිසි ලත් පාර්ශවය** - පී සෝමසිරි බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2017.11.20 |
| තොරතුරු නිළධාරියා තීරණය ලබා දුන් දිනය | 2017.12.06 |
| නම් කල නිළධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2017.12.12 |
| නම් කල නිළධාරියා තීරණය ලබා දුන් දිනය | No response |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.01.03 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2017.11.20 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*මිනුවන්ගොඩ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය රු 109750.00 ක මුදලක් අයථා පරිහරණය සම්බන්ධයෙන් නිසි පරීක්ෂණයක් කර අවශ්‍ය පියවර ගන්න ලෙස අදාළ නිලධාරීන්ට නියෝග කරන ලෙසත් මෙම වංචාව යටපත් කිරීමට කටයුතු කළ නිලධාරීන්ට විරුද්ධව විනයනුකූලව කටයුතු කරන ලෙසත් ඉල්ලා 20.07.2017 දිනැතිව ආණ්ඩුකාර ලේකම්තුම වෙත් යවන ලද ලිපිය සම්බන්ධයෙන් ගත පියවර පිළිබඳ විස්තර.*

තොරතුරු නිලධාරියා 2017.12.06 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ තොරතුරු සැපයීමට තීරණය කර ඇති බවත් තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් සොයා බලා වහාම වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා බස්නාහිර පළාත් සමුපකාර අමාත්‍යාංශයේ ලේකම් වෙත 2017.08.02 දිනෙන් ලිපියක් ද 2017.11.09. සහ 2017.11.30 දිනයන්හි සිහිකැඳවීම් දෙකක්ද යවා ඇති බවත් ය. එනමුත් අදාළ වාර්තා පොදු අධිකාරිය වෙත ලබාදී නොමැති බව ද දන්වා ඇත. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2017.12.12 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.01.03 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය 2018.02.07 දිනැතිව අභියාචක, තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති පරිදි, අභියාචක විසින් 20.07.2017 දිනැතිව ආණ්ඩුකාර ලේකම්තුමා වෙත යවන ලද ලිපිය සම්බන්ධයෙන් ගත් පියවර දන්වා ඒවා ඇති බව පෙනී යයි. 2018.02.07 දිනැති ලිපිය පහත පරිදි වේ.

> *ඔබගේ ලිපියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සමුපකාර අමාත්‍යාංශ ලේකම් වෙතින් වාර්තාවක් කැඳවන ලදුව, මේ සම්බන්ධයෙන් සමුපකාර දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂනයක් පැවැත්වූ බවත් මේ සමන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරණ සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1998 අංක 03 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 58 වන වගන්තියට අදාළව තීරකකරණයට යොමු කරන ලෙස සමිතියට උපදෙස් ලබා දුන් බවත් දන්වා ඇති බව කාරුණිකව දන්වමි.*

**නියෝගය:**

පොදු අධිකාරිය අවශ්‍ය තොරතුරු ලබා දී ඇති බැවින් අභියාචනය අවසන් කර සිටිමු.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු.
*****